ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2020 අප්‍රේල් මස 16 වන දින** |

**ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු අනුපාතිකය අඩු කරයි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2020 අප්‍රේල් මස 15 වැනි දින පැවැති රැස්වීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), 2019 මැයි මස 31 වන දින සිට සමස්තයක් ලෙස පදනම් අංක 200 බැගින් පහළ දැමීම සලකා බලමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අනුපාතිකය පදනම් අංක +300 ක ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හැරීමට තීරණය කරන ලදී.

ඒ අනුව, 2020 අප්‍රේල් මස 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, හදිසි අවස්ථාවන් වලදී යොදාගත හැකි පරිපාලනමය වශයෙන් තීරණය කරනු ලබන අනුපාතිකයක් වන බැංකු අනුපාතිකය, සියයට 15.00 සිට සියයට 10.00 ක් දක්වා පදනම් අංක 500 කින් අඩු කර ඇත.